සුබෝධා ජ්‍යොතිශ සේවය - මෙල්බර්න්




"ශනි ඒරාශ්ඨකය" යන්න ඇසෙත්ම බොහෝ දෙනාට ඇති වන්නේ යම්කිසි බියකි. ජ්‍යොතිෂය ගැන විශ්වාසයක් නැති හා එවැනි තත්වයක් පිටතට පෙන්වන අයද ඇතැම් විට ශනි ඒරාශ්ඨකය ගැන සැලකිලිමත් වෙති. ඒරාශ්ඨක සමයේදී කේන්ද්‍ර හිමියා නොමරා මරන තරම් අපල තත්වයක් ඇති බවට මතයක් තිබීම මීට හේතු සාධක වේ. විශ්ණු දෙවියන්ට වසර 19ක් බටකොළ කවාපු දේව කතාව මේ හා බැඳී ඇති පෞරාණික කතාන්දරයකි. එමෙන්ම සිදුහත් තවුසාණන්ට සය වසරක දුෂ්කර ක්‍රියා කාලාය තුල ශනි ඒරාෂ්ඨකයක් තිබූ බව කියයි.

බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් හෙලිකල දැනට පිලිගෙන ඇති බුද්ධ කේනද්‍රය අනුව මෙය ප්‍රත්‍යක්‍ෂ සත්‍යයක් බව පෙනී යයි.



ශනි කේන්ද්‍රයේ අට වැන්නෙහි ගමන් කරන වසර 7 X ක කාලයයි.

ඒරාෂ්ඨක වල අසුභ පල වැඩිවන අවස්ථා හා ඒ සඳහා බලපාන කරුණු.

, ලග්න හිමියා ගත කරන දශා කාලය

, ලග්න ඒරාෂ්ඨකයේ වැඩිම අසුභ බල පෑම ඇත්තේ ශනි, ලග්න ස්ථූපය දෙස අංශක 30 තුල (ඉදිරියට අංශක 30 ක් හා පසුපසම අංශක 30ක්) ගමන් කරන වසර 5ක කාලයයි.

, ලග්න, ජම්ම හා ජම්ම, අෂ්ඨම ඒරාෂ්ඨක 2ක් එකවර යොදන අවස්ථාවල අඑල වැඩිය.

ඇතැම් ලග්න හිමියන්ට ඒරාෂ්ඨක අපලයේ බලපෑම අඩුය. එමෙන්ම ඇතැම් ලග්න හිමියන්ට එහි බලපෑම වැඩිය.

කෙනෙකුගේ ඒරාෂ්ඨක කාල යෙදෙන්නේ කෙලෙසද, ඒවායේ බල දුබලතා කෙසේද ඉන් ආරක්‍ෂා වීමට කල යුතු වත් පිලිවෙත් මොනවාද යන්න පලපුරුදු දෛවඥයකු ලවා පරීක්‍ෂා කල යුතුය.

# ශනි ඒරාෂ්ඨක අපලය

ශනි ඒරාෂ්ඨකය ගැන විශේෂයෙන් සඳහන් වෙතත් එම ඒරාෂ්ඨකයේ තද ගතිය අඩු වැඩි වීම ඇති කෙරෙන විශේෂ තත්වයන්ද ඇත. සමහරවිට ඒරාෂ්ඨක කාලය කිසිදු කරදරයක් නැතිව ගෙවී යාමද සිදුවිය හැක. මෙවැනි තත්ත්ව නිවැරදිව දැකිය හැක්කේ පලපුරුදු දෛවඥයකුටය. මෙම ලිපියේ අරමුණ වන්නේද ශනි ඒරාෂ්ඨකය පිළිබඳ මූලික දැනුමක් ලබාදීම හා ඒවා ජන්ම කේනද්‍රයක යෙදෙන ආකාරය හා එහි අසුභ ප්‍රභලතා තීරණය කෙරෙන අයුරු ගැන වටහා දීමක් කිරීමටය.

ශනි ඒරාෂ්ඨකය ආකාර තුනකි.

1) ජම්ම (ජන්ම) ඒරාෂ්ඨකය (චන්ද්‍ර ඒරාෂ්ඨකය කියා ද හඳුන්වයි.)
2) ලග්න ඒරාෂ්ඨකය
3) අෂ්ටම ඒරාෂ්ඨකය

**1) ජම්ම (ජන්ම) ඒරාෂ්ඨකය (චන්ද්‍ර ඒරාෂ්ඨකය)**

ජම්ම ඒරාෂ්ඨකය යන උපතේදී චන්ද්‍රයා සිටි රාශියට ගෝචර ගමනින් ශනි ග්‍රහයා පැමිණීමයි. ශනි ග්‍රහයා සාමාන්‍යයෙන් එක් රාශියක් තුල වසර 2 X ක් පමණ ගමන් කරයි. ශනි, සඳු සීමිත රාශියට පෙර රාශියේ (සඳුගෙන් දොලොස්වැන්න), සඳු සිටින රාශිය සහ සඳුගෙන් දෙවැන්න යන රාශිවල ගමන් කරන කාල සීමාව ජන්ම ඒරාශ්ඨක කාලයයි. ඒ අනුව ජන්ම ඒරාෂ්ඨක කාලය වසර 7 X කි.

**2) ලග්න ඒරාෂ්ඨකය**

ශනි දොලොස්වැන්නේත්, ලග්නයෙත්, දෙවැන්නේත් ගමන් කරන වසර 7 X මෙම කාලයයි.

**3) අෂ්ටම ඒරාෂ්ඨකය**

**ශනි ඒරාෂ්ඨකය ගැන සඳහන් වෙනත් විශේෂ කරුණු,**

, කුඩා කාලයේදී ලැබූ විට ලෙඩ රෝග පීඩා මුරණ්ඩුකම්, දෙමාපියන්ට කරදර, වැටීම, තුවාල වීම්, ශරීරය කෙට්ටුවීම් ආදිය සිදු වේ.

, ඉගෙන ගන්නා වයසේදී ලැබූ විට අධ්‍යාපනය එපා වේ. නිවෙස්වලින් පැන යාමට සිත් වේ.

, රැකියා කරන තරුණ වයසේදී ලැබූ විට රැකියා පීඩා ඉස්මතු වේ. මුරණ්ඩු ගති නිසා රැකියාව නැති කර ගනී. උඩඟු ගතියක් ඇතිවේ. අපලය නිමවෙද්දී ඉබේම රැකියා, ධනය, දියුණුව ඇති වේ.

, විවාහ අවධියේදී ලැබූ විට සහකරු/සහකාරියටද අඑල කරයි. සියලු අංශයෙන්ම දියුණුව අඩාල කරයි. විවාහයේ මුල් වසර කීපය තුල ලැබූ එම තත්වය බරපතලය.

, අවුරුදු 30ට වැඩි අයට බොහෝ විට අපලය යෙදෙන්නේ දෙවන බර හෝ ඊට වැඩි වාරයක නිසා, එය බිඳ දරා ගැනීමේ හැකියාවක් ඇත.

ඉහත කරුණු අනුව ගත් කල වැඩිපුර ඇත්තේ අපල කාල සීමා විස හොඳ කාලයක් නොවේ යැයි කෙනෙකුට සිතුනත්, මෙම තත්වය සෑම විටම බල නොපවත්වයි. නමුත් යාථාර්තය නම් ඕනෑම ජීවිතයක සැප විඳීමට වඩා වැඩියෙන් සිදු වන්නේ දුක දොම්නස විඳීමයි. මෙම සනාතන දහස මෙයින්ද ඔප්පු වේ.



# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## අතරුවන් ලැබූ දාට දැනෙයි අම්ම කමක රගේ

හැන්දෑකොරේ මලීත් එක්ක දිය බුං ගහන්ට මනාපෙන් වැවට ළං කෙරුවත් කාටදෝ අඩාපාලි කියමින් වෑ කණ්ඩිය දිගේ ගමන් ගස්සන කොයින් මාමා ඇහැගැටුණායින් උන්දෑ පස්සෙ වැටුණා.

"බොලං මාමා.. කොහේ උඹ මේ ආත බූත කඩාගෙන දුවන්නෙ? ඔහොම ඉඳ මාත් එනවා.."

"බෝ යන අහක යම.. මං සිළිඳිගෙ පැලට ගොඩ වෙලා එන්නං.."

මොනවා කිව්වත් මාත් වැටුණා උන්දැ පස්සෙ. සිළිඳි අත්තම්මා උන්දැගෙ පවුලෙ ළඟම ඇත්තියක්. මං හිතන්නෙ නෑ දෑ කමට මාමාග අක්ක කෙනෙක්. සිළිඳි අත්තම්මා දැන් ඉන්නෙ ලෙඩ ගානෙ. ඒත් මොකෑ කොයින් මාමා හිටි ගමන් පරළ වුණේ? මාමා පැල් කොටේට ගොඩ වුණේ සිළිඳිගෙ දුවට මහා ගෝරනාඩුවක් කරගෙන.

"බොල පරට්ටි.. අත දරුවා කාලෙ තිගේ දහ ජරාව අත ගෑවෙ මේකි මිස අහවලාද බොල? දැං ඒකිගෙ අත පය වාරු නැතිවා. තී මනාප නැතුවා තිගේ අම්මගෙ කිළිකුණු අතගාන්ට.. බොටත් තේරෙයි දුව කවදා හරි පැටව් හදපු දාට අම්මගෙ අගේ. මේකිට අරෝවක් වුණොත් බලාගිය. . මං තී අතපය ගැට ගහලා දිමි ගොටු ඉහ ලනවා.."

ගෝරණාඩු කළ කොයින් මාමා ආපසු ගෙදර ගියේ හොඳටම තරහින්.. මා වැව ළඟට යන විටත් මලී නගා දිය නා අහවර වී ආපයු යන්ටත් තනයි.

"මොකෑ අයියණ්ඩි උඹ සුනංගු ..? උඹ එනකං බලා උන්නා සුවඳ කැට ඇඟ උලන්ට.. "
"නගා මං සිළිඳි අත්තම්මගෙ පැලට ගොඩ වුණා කොයින් මාමා එක්ක.."
"අර අහවල් එකටයෑ..? "
"උන්දැගෙ අත පය වාරු නැතුවා.. දූ ඩිංග උන්දැගෙ සුමේ කරන්නැතුවා කියලා කොයින් මාමා ගොරණාඩු කළේ.

"ඒක නොවෑ අයියණ්ඩි. ඒකි අම්මා බලා කියා ගන්ට එපායෑ. නිස්කාරණේ පව් පොදි ගහනවා. උන්දෑ තව කී දොහක් ඉඳීද.. "

"උඹ වගේ නෙවෙයි නගා.. ඒකි වස නපුරුයි.. උන්දැලත් ඒකිට කරුණු කාරණා කියා දීලා නැතුවා. ඒක නොවෑ ඔය.."

"නගා උඹ අම්මල හොඳට සළකනවද?"
"ඔව් අයියණ්ඩි ඒ මගේ අම්ම නොවෑ.. උඹ මෙහෙම අහල තියෙනවද අයියණ්ඩි..?"

අත දරුවූ එදා උඹේ කැත කුණු අතගාපු මගේ
අතපය දැන් වාරු හිඳී අතදරුවෙක් වගේ ඇගේ
කැත කුණු මගෙ අතගාන්න උඹ දුව හිරිකිතයි වගේ
අතරුවන් ලැබූ දාට දැනෙයි අම්ම කමක රගේ

"ඕකිටත් පැටව් වදපු දාට අම්මගෙ අගේ තේරෙයි.."

කොයින් මාමා කී දේ සහසුද්දෙන්ම මේකි ගලපලා කියාලු හැටි? මං පුදුම වෙලා මලී දිහා බැලුවා.

"විජහට දිය නා ගනිං නංගි.. උඹ ගෙට ගොඩ කරලාම යන්නං.. ඉර ගල වැටෙන්ටත් කිට්ටුයි.. "
"පස්සෙන් පහු උඹට කැලෑ ගං වල කවි කතා මහ හුඟක් කනේ තියන්නං.."
උඩිං පල්ලෙන් දිය නා අහවර කර ගතිමි.

"යම නගා.. කොයින් මාමා අපටත් ගෝරණාඩු කරයි.."

ගේ ළඟටම මා සමග ආ මලිත්ති නගාත් හෙට වැව ළඟදී හමුවෙන බලාපොරොත්තුවෙන් සමුගත්තෙ මෙලෙසයි.

"අපි යනෝ අයියණ්ඩි.. උඹ එනකොට සුවඳ කැටයක් මට ගෙනෙං.." හීන් නගා පැවසුවේ මාත් මලීත් දෙදෙනාම සිනාගස්සමින්.

බෝගල